HNB GRAMEEN

# මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

4 කාණ්ඩය – දෙවන කලාපය – 2015 ජූලි



නිරූපනය : එස්. එල් ඉන්ද්‍රාණි මහත්මිය

එච් එන් බී ග්‍රාමීන් මහනුවර ශාඛාවේ සාමාජිකා

ඡායාරූප : ලක්ෂමන් කුමාරතුංග




ජීවිතයට අරුතක්

# ජීවිතය වෙනස් කරන හැරවුම් ලක්ෂ්‍යය (Turning Point)

ඔබගේ මගේ හැම අයෙකුගේම එකම පැතුම එකම අධිෂ්ඨානය තම ජීවිතය සාර්ථකත්වයට පත්කර ගැනීමයි. ජීවිත සාර්ථකත්වයට පත්කර ගැනීම අපගේ පැතුම හා අධිෂ්ඨානය වුවත් ලෝකයේ ජීවත් වන මිනිසුන්ගෙන් 5% අඩු ප්‍රමානයකි තමාගේ ජීවන සිහින සැබෑකර ගන්නේ. එසේ නම්....ඔබත් ඔබගේ ජීවිත සිහින සැබෑකර ගන්නකු වීමට කැමතිද? ඔබ සිහින සිත්තුළ තබාගෙන සිටියාට ඒවා සැබෑවන්නේ නැත. ඔබ දෙවියන්ට හෝ වෙනත් අයෙකුට යැදීමෙන්ද ඔබට ඔබගේ සිහින සැබෑකර ගත නොහැක. ඔබගේ හඳහන හොඳ වු පලියට ඔබට සිහින සැබෑ කරගත නොහැක. එසේනම් ඔබගේ අනාගත ජීවිත සිහින සාර්ථක කර ගැනීමට හැකි පූර්වාදර්ශයන් පිළිබඳ ඉඟි සපයන මෙම ලිපි මාලාව ඔබගේ ජීවන ගමනේ සාර්ථකත්වය උදෙසා කිසියම් පිටුවහලක් සපයනු ඇතිය යන්න මාගේ විශ්වාසයයි. එමගින් ඔබට ඔබගේ ශක්‍යතාවය නැතහොත් ඔබගේ සැගවුනු ශක්තීන් අවදිකර ඔබගේ ඉලක්කයන් කරා පහසුවෙන් ලඟා වීමට ඉඩකඩ සලසනවා ඇත.

ඔබට ඔබගේ ජීවිතය බරක්ද? නැතිනම් ජීවිතය සුන්දරව විඳිමින් සිටිනවාද? අප රටේ බහුතරයක් තරුණ තරුණියන්ගෙන් තම නිසි වයසේදී තමාගේ සාර්ථකත්වයට පැමිණෙන්නේ අතලොස්සකි. බහුතරය මානසික පීඩනයෙන් හා අසහනයෙන් ජීවත් වේ. නමුත් එලෙස ජීවත් වීමෙන් සිදුවන්නේ තමාගේ වටිනා ජීවිතය තවතවත් අඳුරින් අඳුරට තල්ලු කර ගැනීමයි.

අප රටේ මෙන්ම විදේශයන්හිද ඉතා අසාර්ථක තත්වයේ තිබූ තම ජීවිත අතිශය සාර්ථකත්වය කරා මෙහෙය වූ අය පිළිබදව අපි ඉදිරියේදී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

අම්මා අහිමි වූ සිය කීදේ නාහන දඟකාර දරුවාට තාත්තා පුංචි අම්මා කෙනෙක් ගෙදරට ගෙනාවේය. බොහෝ අය සිතුවේ කුඩම්මා කෙනෙක් ගෙදරට ගෙනා විට දරුවාට තවදුරටත් ආදරය අහිමි වී අකීකරු දරුවා තව තවත් දඩබ්බරයකු වනු ඇති බවයි. දරුවාගේ පියා පවා සිය දෙවන බිරිඳට අනතුරු ඇඟවූයේ ඔහුගේ දඟකාර දඩබ්බර ගති පැවතුම් වලින් ප්‍රවේසම් වන ලෙසයි. එහෙත් දරුවාගේ කුඩම්මා මේ දඩබ්බර කොලු පැටියාට අතිශයින් ආදරය කළාය.මවගෙන් පවා නොලැබුණු තරමේ ඒ ආදරය හමුවේ හීලෑ වු කොලු පැටියා පසුව ලෝක ප්‍රසිද්ධියට පත් වන්නේ විශිෂ්ඨ දේශකයකු ලෙසය. නැපෝලියන් හිල්ගේ හැරවුම් ලක්ෂ්‍යය වූයේ ඔහුට කුඩා කාලයේ දැඩි ලෙස දැණුනු ඔහුගේ කුඩම්මාගේ ආදරයය.

එබැවින් අපට යමක් දෙස බැලු බැල්මට එය අවාසියක් සේ දුටුවත් එය තුළට ඔබ යොමු වූ විට එය ඔබට අවාසියක් නොව ජීවිත පරිවර්ථනයකට හේතු වන කරුණක් විය හැක.

ලංකාවේ රත්නපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක දෙකටම මායිම් වූ අති සුන්දර වූ පලාතක් ඇත.එම ප්‍රදේශය සූරියකන්ද ප්‍රදේශයයි. මෙම කන්දට සූර්යා පතිත වීමෙන් අතිශය සුන්දර පරිසරයක් නිර්මානය කිරීම හේතුවෙන් මෙම නම භාවිත වන බව කියවේ. මෙම ප්‍රදේශයේ පෙර පාසල් ගුරුවරියක් පෙර පාසලක් පවත්වාගෙන ගියාය.ඇය නමින් මංජුලාය.

මංජුලා පෙර පාසල් ගුරුවරියක් ලෙස කටයුතු කළ අතර ස්වාමි පුරුෂයා රජයේ ආයතනයක නිලධාරියකු ලෙස රැකියාව කළාය. මංජුලා පෙර පාසැල් ගුරුවරියක් වුවද එම ගුරු වෘත්තියෙන් ලැබෙන ආදායම අභිබවා යන ණය බරක් ඇය හා ස්වාමියා වෙත පැටවී තිබිනි. මේ තත්වයෙන් ගොඩ ඒමට විකල්ප සෙවූ මංජුලා තමාගේ පෙර පාසල අවසන් වීමෙන් පසු ඉතිරි කාලය ව්‍යාපාරයක් ඇරඹීම හා සාර්ථකව කරගෙනයාම පිළිබඳ පුහුණු පාඨමාලාවකට සහභාගී වීමට වෙන් කළාය. මෙම පාඨමාලාව සති 2කට ආසන්න කාලයක් පැවැත්වුනි. එම වැඩසටහන අවසන් වීමෙන් පසු මංජුලා අළුත්ම අදහස් ඇති වෙනසකට කැමති කාන්තාවක් බවට පත්විය.

මංජුලාගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය වූයේ ඇය මුහුණ දුන් උග්‍ර ණය බරයි. ඊට විසඳුමක් සොයා ඇය සහභාගී වූ පුහුණු වැඩසටහනයි. උග්‍ර ණය බරට විසදුමක් සොයන්නට උත්සුක නොවන්නට අදටත් ඇය මසකට රු. 6000-8000 අතර වැටුපක් ගන්නා අයෙක් බව පැහැදිලිය. නමුත් මෙම දිරිය කත හදහන හා වෙනත් බලවේග පසෙකට දමා තමාගේ නිර්මාණශීලී සිතිවිලි පාවිච්චිකර තමාගේම ව්‍යාපාරයක් ඇරඹීය. එය සකුරා තල කැරළි ව්‍යාපාරයයි. අදවනවිට හංවැල්ල අවිස්සාවේල්ල ආදී ප්‍රදේශවල ඇයගේ තලකැරලි නිෂ්පාදන වෙළෙඳපලේ මිලට ගැනීමට ඇත.මංජුලාගේ යටතේ අදවන විට සේවකයින් 20 ආසන්න ප්‍රමානයක් සේවයේ නියුතුව සිටී.මංජුලා ඇයට අතිරේක ආදායමක් පමණක් නොව ගමේ තම අසල්වැසියන්ට රැකියා අවස්ථාවන්ද ලබා දී ඇත.

ඇයගේ මෙම ජීවිත වෙනසට හැරවුම් ලක්ෂ්‍යය බවට පත්වුයේ ඇය ජීවිතයට අළුත් ආදායමක් එකතු කර ගැනීමට සිතේ පහළ වූ උනන්දුව හා ඒ ඔස්සේ ඇය සහභාගී වූ ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාවයි. ඔබටත් ඔබ ජීවිතය වෙනසකට ලක්කර ගැනීමට අවශ්‍ය නම් ඔබත් ඔබගේ හැරවුම් ලක්ෂ්‍යය සොයාගන්න.

මේ ආර්ථික දුෂ්කරතා, ණයබර නිසා බහුතරය තම දිවිය පවා තොරකර ගැනීමට කල්පනා කරන කාලයකි. නමුත් ඇතැමකු එසේ නොසිතා තම ජීවිතය එතෙක් ආ මගින් වෙනස් කොටගෙන නව මාවත් විවර කර ගැනීමට වෙහෙසේ. ඔබත් එවැනි මානසික ශක්තිවන්තයකු වීමට අදිටන් කරගන්න. එමගින් ඔබ ජීවිතයට අළුත් ආලෝකයක් ලැබෙනු ඇත.

අප රටේ බොහෝ අය අවස්ථා තුළ පවා දකිනුයේ දුෂ්කරතාය. එනම් යමෙකුට අළුත් යමක් කිරීමට අවශ්‍ය වූ විට ඒක හරිම අමාරුයි. උදව්කරන්න කෙනෙක් නෑ, මට මේ ගැන අත්දැකීම් අඩුයි. වැනි සෘණ අදහස් වලින් ඔබම ඔබගේ ඉදිරි ගමන වලකාලයි. නමුත් ඉතා සුළු පිරිසක් දුෂ්කරතා තුළින් අවස්ථා දකී. ඔබත් එවැන්නකු වී තමන්ට ලැබෙන අවස්ථාවන්ගෙන් සහ නව මාවත් විවර කර ගැනීමට උත්සුක වීමෙන් ජීවිතයේ නව වර්ණයන් සොයා ගනී. ඔබත් එවන් අයකු වීමට අදිටන් කරගන්න. වහාම දැන් දැන්ම ඔබගේ ජීවිත හැරවුම් ලක්ෂ්‍යයට සොයායන්න. එතුළින් ඔබගේත් අපගේත් ජීවිත සුබිත මුදිත කර ගැනීමට හැකි වෙනවා ඇත❑



**ප්‍රේමසිරි ගමගේ**
සභාපති, ව්‍යාපාර සංවර්ධන කෙන්ද්‍රය.

# ග්‍රාමීන් ශක්තියයි

# ඇගේ දිරියයි



## "මට තවම මතකයි අපි අනුන්ගේ බේකරි කුලියට අරගෙන වැඩ කරපු කාලෙ..."

**- මාලනී රාජපක්ෂ**

අඹතැන්නේ සිට කළුවානට යන මාර්ගය තාර හා පලින් පල කොන්ක්‍රිට් යෙදූ මාවතක් වුවද පල්ලම් හා කඳු නැග බැස යන ඒ ගමන වංකගිරියකට යන ගමනක් බඳු යැයි විටෙක සිතෙන්නේ මාර්ගයේ ඇති දුෂ්කරතාවය නිසාමය. පලින් පල ගල් මතු වී ගැලවී ඇති මාර්ගයේ ඉදිරියෙන් තවත් වාහනයක් ආවොත් පාරෙහි ඉඩකඩ ඇති තැනක් සොයා පිටුපසට යෑමට සූදානම් සිතක් මේ මගෙහි ගමන් ගන්නා සෑම රියදුරෙකුම සතු වීම අනිවාර්යය. මාවතෙහි හැඩ තල විමසමින්ද, බේකරි ගෙදරට යන මාර්ගය විමසමින්ද අප ඉදිරියට ඇදුනේ ජීවන ගමනේ ද මෙබදුම කඳුපල්ලම් ප්‍රපාත අඩුනැති වගට සිතන්නට සිතට ඉඩදෙමිනි. දහවල ගෙවී යමින් තිබේ. ඈතට දැනෙන පාන් පුච්චන සුවඳ බේකරියක් ළඟ බව නැහැයට දනවයි. බඩගින්න අවුස්සන සුළු ඒ සුවඳ දිගේ මඟ අසාගෙන අපි ඇගේ නිවස ඉදිරියට පැමිණියෙමු. මාලනී චන්ද්‍රලතා රාජපක්ෂ, ඒ ඇගේ නම. සැමියා සමඟ එක්ව බේකරි ව්‍යාපාරයක් පවත්වාගෙන යන මාලනි චන්ද්‍රලතාට අප කළ ඇරයුමට අනුව ඇය සිය දිරිය කතාව මෙසේ අප හමුවේ ගොනු කළාය.

"මම මාතලේ මානිංගමුවෙ. අපේ අම්මයි, තාත්තයි දෙන්නා කළේ ගොවිතැන. වී ගොවිතැන හැරුණාම එළවළු වගාවත් අපි කළා. සහෝදර සහෝදරියෝ 6 දෙනෙක් හිටිය පවුලක මම හතරවෙනියා. අප හය දෙනෙක්ව ජීවත් කරවන්න ගොවිතැනෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවුණු තැන අපේ අයියා රට ගියා රස්සාවකට. ඒ එව්ව මුදල් වලින් තමයි අපි ටික දුරකට හරි ඉගෙන ගත්තේ. කොහොම හරි මගේ පාසල් ගමන සා.පෙළ පංතියෙන් කෙළවර වුණා. ඒකට එක හේතුවක් වුනේ පොඩිකාලේ මම හුඟක් වෙලාවට අසනීප වෙන ළමයෙක් විම. ඒ නිසා ගොඩක් වෙලාවට විභාග වලට පෙනි හිටින්න මට අපහසු වුණා. ඉස්කොලෙන් අස් වෙලා ටික කාලෙකින්ම මම විවාහ වුණා.ඒක යෝජිත විවාහයක්. මහත්තයා රස්සාව විදිහට කළේ බේකරි රැකියාවක්. ඒ රස්සාවෙන් ලැබුණු පඩිය අපිට මාසේ වියදම පියව ගන්න තරම්වත් ප්‍රමාණවත් වුනේ නෑ. මේ තත්වයෙන් මිදිලා ජීවිතේ යහපත් ආර්ථික මට්ටමකට ලඟා කරගන්නයි අපි මුල ඉඳලම උත්සාහ කළේ. ඒ උත්සාහයේ පළමු පියවර වුණේ මහත්තයා කුරුණෑගලින් බේකරියක් කුලියට අරන් ඒකේ පාන් බනිස් වගේ බේකරි කෑම හදන්න පටන් ගැනීමයි. මට තවම හොදටම මතකයි. ඒ කාලේ අපි ජීවත් වුණු ගේ. ඒක දුප්පත් කමින් පිරුණු පුංචි ගෙයක්. කොටින්ම බිමට සිමෙන්ති ටිකක්වත් දාගන්න වත්කමක් අපිට තිබුනේ නෑ.

අළුත් බේකරිය පටන් අරන් පාන් බනිස් වර්ග හදලා මහත්තයම තමයි තනියෙන් බයිසිකලේ පටවගෙන ගිහින් කඩ වලට ඒවා දැම්මේ. මේ විදිහට අවුරුදු පහළොවකම කාලයක් පුරා අපි ඒ බේකරියෙන් ලැබෙන ආදායමින් ජීවත් වුණා. ඔය කාලෙම තමයි අපි මේ දැන් ඉන්න ගෙදර හදන්නත් මුල් පිරුවේ. බේකරියේ ඕනම වැඩක් මටත් කරන්න පුළුවන්. මොකද මහත්තයා නැති වෙලාවට මම තමයි අඩු පාඩුවක් නැතිව ඒ කටයුතු සර්ව සම්පූර්ණ ලෙස ඉටු කරන්නේ ග්‍රාමීන් සමාගම අපේ පළාතට ඇවිල්ලා මුලින්ම හදපු මධ්‍යස්ථානය තමයි කළුවාන මධ්‍යස්ථානය. ඒකේ මුල්ම සාමාජිකයා මම. ඒ වෙද්දි ව්‍යාපාරය සඳහා මුදල් පිළිබඳ ප්‍රශ්නයක අපි මැදිවෙලා හිටියා. ග්‍රාමීන් සමාගම ගැන යම් තරමකට මම දැනගෙන හිටියා. ඒ දැනගෙන තිබුණු දේවල් වලින් මා සිත තුළ තිබූ විශ්වාසය ග්‍රාමීන් සමාගමේ සාමාජිකාවක් වෙලා ගතවුනු මේ වසර ගණනාව තුළ තව තවත් තහවුරු වුණා මිසක එක දශමයකින්වත් අඩුවෙලා නෑ.. ග්‍රාමීන් සමාගම අර්බුදකාරී අවස්ථාවේ පවා අපි වෙනත් මූල්‍ය සමාගම් වෙත නොගොස් කවදා හරි ග්‍රාමීන් සමාගම ශක්තිමත්ව නැගී සිටිනු ඇතිය යන විශ්වාසයෙන් බලා සිටියා. අද ඒ සිහිනය සැබෑ වෙලා. වසර ගණනාවක් පුරා ග්‍රාමීන් සාමාජිකාවක් වෙලා හිටිය අපිට ඇත්තටම ඒ ගැන තියෙන්නේ විශාල සතුටක්. මොකද අපි ආර්ථික අහේනියකට ගොදුරු වෙලා අසරණව හිටිය මොහොතක ග්‍රාමීන් සමාගම අප ගැන දැක්වූ අනුග්‍රහය, හිතවත්කම, අපට කවදාවත් අමතක වෙන්නේ නෑ. මට තවම මතකයි අපි අනුන්ගේ බේකරි කුලියට අරගෙන වැඩ කරපු කාලේ - ඒ කාලේ අපේ තිබුණු ලොකුම හීනය තමයි අපේම බේකරියක් පටන් ගන්න එක. ඒ හීනේ හැබෑ කරගන්න ග්‍රාමීන් සමාගමත්, ඒකේ ණය ක්‍රමයත් අපිට විශාල පිටුවහලක් වුණා. දැන් අද වෙද්දී අපේ ගෙදරට පිටිපස්සේ කොටසෙ අපි බේකරියක් කරනවා. දර පෝරණු පාන් වලට ලොකු ඉල්ලුමක් මේ පළාත්වල තියෙන නිසා තරමක් දුක් විඳින්න සිද්ධ වුණත් අපි දර පෝරණුවෙම තමයි පාන් බනිස් වර්ග පුච්චන්නේ. 5000 මුදලකින් පටන් ගත්තු ග්‍රාමීන් ණය 80,000 - 100,000 දක්වාත් ඊට වැඩි ගණන් වලට වෙනකනුත් අපි අරගෙන තියෙනවා. අවශ්‍යතාව අනුව ණය ගන්න කියලා ග්‍රාමීන් සර්ලා නිරන්තරයෙන් අපිට කියන නිසා අනවශ්‍ය ණය බරක් අපිට නෑ. අද වෙද්දි අපි ළඟ හතර දෙනෙක් වැඩ කරනවා. ත්‍රී වීලර් වලින් එන ජංගම පාන් අළෙවි රථ නිසා අපිට යම් පහරක් වැදුනත් අපේ පාන් වලට පුරුදු වුනු පිරිස් මේ පාන්ම තමයි මිළදී ගන්නේ. අද වෙද්දී සියළු බේකරි කෑම වර්ග පාන් බනිස් කේක් වගේ හැම ජාතියක්ම අපි හදනවා."

එතෙක් පෝරණුවේ පිළිස්සුණු පාන් මේ වන විට හොඳ ගානට තැම්බී අවසන් ය. දැන් එළඹ ඇත්තේ ඒවා කඩ වලට බෙදා හැරීමේ මොහොතයි. ඒ සඳහා මාලනී ගේ සැමියා සූදානම්ව සිටී. උණු උණුවේ දුම් දමන පාන් සුවඳ හාත්පස වෙලා ගනිද්දී අපි මාලනීට සමුදුන්නේ සිය ව්‍යාපාරය තව තවත් සාර්ථකත්වයට පත් කර ලන්නට ඇයට දිරිය ශක්තිය ලැබේවා යන අවංක සුබාශිංෂණාය ලෙහි තුළ දල්වාගෙනය.❑



සටහන
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායා - ලක්ෂමන් කුමාරතුංග

**කරන ලද සේවය උපරිමයෙන් කිරීම සමාජ සත්කාරයකි.**

## ප්‍රයිම්ග්‍රාමීන් ශාඛාවක වගතුග



අභිමානයෙන් දැපුණු මිනිසුන්ගෙන් මෙන්ම පාරම්පරිකව පැවතගෙන එන විවිධ වෘත්තීන්ගෙන් කුලගොත් සැදුණු ජන කොටස් ගණනාවක සංකේන්ද්‍රනයක් ලෙස හැදින්විය හැකි මහනුවර, ස්වාභාවික සෞන්දර්ය අතින් මෙන්ම සෞම්‍යවූ දේශගුණික රටාවකින්ද පොහොසත් වූ අපූර්ව පුරවරයකි. ආගමික වටපිටාවකින්ද ඒහා ඈඳුණු සංස්කෘතික හැඩතලයන්ගෙන්ද පොහොසත්වූ මහනුවර මෙවර මෙහෙවර ශාඛාවක වගතුග විමසුමට පාදක වන අප එච් එන් බී ග්‍රාමීන් ශාඛාව පිහිටි නගරය වෙයි. සුවිසල් ප්‍රදේශයක් පුරා පැතිරුණු ගම් නියම්ගම් ගණනාවක් ආවරණය කරමින් එච් එන් බී ග්‍රාමීන් මහනුවර ශාඛාව සිය සමාජ සත්කාර්ය උදෙසා කැපවීම අරඹනුයේ මීට වසර දොළහකට පෙර කාලවකවානුවකදීය. එනම් 2003 වසරේ අප්‍රේල් 11 දාකය.ඒ මහනුවර පේරාදෙණිය පාරේ අංක 678/16 දරන ස්ථානය කේන්ද්‍ර කරගනිමිනි. අදවන විට අංක 677 විලියම් ගොපල්ලව මාවත, මහනුවර යන ලිපිනයෙහි සිය මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යනු ලබන එච් එන් බී ග්‍රාමීන් මහනුවර ශාඛාවට ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවේ හිමි වන්නේ 10 වන ස්ථානයය.

ලක්ෂ සංඛ්‍යාත වූ දිරිය කාන්තාවන් පිරිසකගේ ජීවිත

# අපගේ එකම බලාපොරොත්තුව රටේ සමෘද්ධිය උදෙසා වූ ග්‍රාමීන් වෑයමට වාරුවක් වීමයි

### එච් එන් බී ග්‍රාමීන් මහනුවර ශාඛාව

සමෘද්ධිමත් කරලීමේ කාර්යභාරයට උරදී සිටින එච් එන් බී ග්‍රාමීන් සමාගමේ එම උදාරතර අරමුණ වෙනුවෙන් කැපවී සිටින එච් එන් බී ග්‍රාමීන් මහනුවර ශාඛාවේ හා එහි සාමාජිකාවන්ගේ වගවිත්ති අප සමග කියන්නට එක්වූයේ එහි ශාඛා කළමනාකරු වූ ජනංජය රත්නායක මහතාය.

"මහනුවර කියන්නෙ විවිධ ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් සංකේන්ද්‍රණය වුණු තැනක්. එහිදී සාම්ප්‍රදායික ව්‍යාපාර වලටත් විශේෂ තැනක් හිමිවෙනවා. විශේෂයෙන් පිත්තල කර්මාන්තය. බෙර වර්ග නිෂ්පාදනය. වගේ කර්මාන්ත පරම්පරාවෙන් පැවත එන කර්මාන්ත විදිහට මේ ප්‍රදේශයේ ප්‍රචලිත වෙලා තියෙනවා. ඒ වගේමයි අපේ මධ්‍යස්ථාන පැතිරී ඇති ප්‍රදේශය ඉතා විශාලයි. මේ ප්‍රදේශයන්හි දකින්න පුළුවන් ව්‍යාපාර අතර පිත්තල කර්මාන්තය පිළිමතලාව ගඩලාදෙණිය ප්‍රදේශයේත් බෙර නිශ්පාදනයටම වෙන්වුණු කූරගල ගම්මානයත්, කුළු නිශ්පාදනයට වඩාත් ප්‍රසිද්ධියක් උසුලනු ලබන දවුලගල නාරංවල ප්‍රදේශයත් මේ ප්‍රදේශයට ආවේණික පාරම්පරික ව්‍යාපාර අදටත් ඒ ලෙසටම පවත්වාගෙන යනු ලබනවා. ඒ වගේ ව්‍යාපාර ඇරුණු කොට අනිත් ව්‍යාපාර ප්‍රදේශයක් විදිහට කොටු කරන්න බැහැ.නිමි ඇදුම් ආශ්‍රිත නිශ්පාදන, විවිධ ගෘහ කර්මාන්තයන් හා බැඳුණු ව්‍යාපාර සහ සිල්ලර කඩ, විවිධ කෘෂිකාර්මික වගාවන්, ආදිය ප්‍රධානයි. අපේ සාමාජිකාවන් මේ විවිධ තරාතිරමේ ව්‍යාපාරවල නිරත වෙනවා. ඔවුන්ට එම ව්‍යාපාර පවත්වාගෙන යාමට වගේම අළුතින් ව්‍යාපාර ආරම්භ කිරීමටත් අවශ්‍ය ණය පහසුකම් හා උපදෙස් ලබාදීමට අප සැදී පැහැදී සිටිනවා. අද වන විට අපේ මධ්‍යස්ථාන 200 සාමාජිකාවන් 6877 කට ණය පහසුකම් ලබා දී තියෙනවා.

මහනුවර ශාඛාව මගින් මෙහෙයවනු ලබන මධ්‍යස්ථාන විශාල ප්‍රදේශයක් පුරා විහිදී පැතිරී තියෙනවා.මේ නිසාම මහනුවර ශාඛාව යටතේ පාලනය කරනු ලබන සේවා මධ්‍යස්ථානයක් රිකිල්ලගස්කඩ ප්‍රදේශයේ පසුගිය ජුනි මාසයේ අවසානයේදී විවෘත කරන්න අපි කටයුතු කළා.ඒ අපට යාමට අසීරු රිකිල්ලගස්කඩට ආසන්න ප්‍රදේශයන්හි ජනතාව වෙත අපගේ සේවාව ලබාදීමේ උදාර අරමුණ ඇතිව. මහනුවර ඉඳලා කොළඹ පාරේ කඩුගන්නාව දක්වාත් අනිත් පැත්තෙන් ගම්පල පාරේ වැලිගල්ල දක්වාත්, ගලහ පාරේ දෙල්තොටට යනකනුත් දිගන පාරේ තෙල්දෙණිය දක්වාත් අපේ මධ්‍යස්ථාන 200 ක් ස්ථාපිත කර තියෙනවා. මේ මධ්‍යස්ථාන හරහා එම ප්‍රදේශයන්හි සුළු ව්‍යාපාරවල නිරතව සිටින අප සමාගමේ සාමාජිකත්වය ලබාගන්නා සාමාජිකාවන්හට ණය මුදල් ලබා දීමට අපි කටයුතු කරනවා.

### එච් එන් බී ග්‍රාමීන් මහනුවර ශාඛාවේ නිළධාරී මඬුල්ල

**ප්‍රාදේශීය කළමනාකරු**
සුදත් විමලසූරිය

**ප්‍රාදේශීය ගණකාධිකාරී**
රංගන මල්ලවආරච්චි

**ශාඛා කළමනාකරු**
ජනංජය රත්නායක

**සහකාර කළමනාකරු**
වසන්ත වැලිකැටිය

**සහකාර කළමනාකරු**
සංජීව මුණසිංහ

**ශාඛා ගිණුම් ප්‍රධානි**
ඉංදික අසේල

**ක්ෂේත්‍ර කළමනාකරු**
අජිත් පුෂ්පකුමාර
නිරංජන් සෙනරත්

**විධායක නිළධාරී, තොරතුරු තාක්ෂණ**
ඒ.පී.කේ. සමරනායක

**ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර විධායක නිළධාරී**
ඉන්ද්‍රජිත් කුමාර

**ජ්‍යෙෂ්ඨ ගිණුම් නිළධාරී**
කසුන් ප්‍රියංක

**ක්ෂේත්‍ර විධායක නිළධාරී**
බණ්ඩාර ඒකනායක
චාමර බණ්ඩාර
අබේසිංහ ගලහිටියාව
සොමිරුවන් වික්‍රමසිංහ
නිශාන්ත බණඩාර
චතුරංග කරුණාවර්ධන
ගයන්ත ගුණතිලක
කුමාර ජයරත්න
රුවන් අචලංක
සඳරුවන් තෙන්නකෝන්
අජිත් වීරකෝන්
බණ්ඩාර විතානගේ
සුරංග රත්නායක

**ගිණුම් සහායක**
විජය කුමාර්
මධුශංක වෑකඩපොළ
අමිල බණ්ඩාර

**විධායක නිළධාරී - ඉතුරුම්**
කුමාර බණ්ඩාර

**විධායක නිළධාරී - අධිකරණ**
කුමාර අබේරත්න

**සටහන -**
**මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි**
**ඡායාරූප -**
**ලක්ෂමන් කුමාරතුංග**

**තමාගේ ඉලක්ක හොඳින් හඳුනා ගෙන සිතීම හා පැතීම සිදුකළ යුතුය.**



**සුදත් විමලසූරිය**
ප්‍රාදේශීය කළමනාකරු



**රංගන මල්ලවආරච්චි**
ප්‍රාදේශීය ගණකාධිකාරී



**ජනංජය රත්නායක**
ශාඛා කළමනාකරු



**වසන්ත වැලිකැටිය**
සහකාර කළමනාකරු



**සංජීව මුණසිංහ**
සහකාර කළමනාකරු



**ඉංදික අසේල**
මූල්‍ය අංශ ප්‍රධානි



**අජිත් පුෂ්පකුමාර**
ක්ෂේත්‍ර කළමනාකරු



**නිරංජන් සෙනරත්**
ක්ෂේත්‍ර කළමනාකරු



එච් එන් බී ග්‍රාමීන් සමාගමේ මහනුවර ශාඛාවේ කාර්ය මණ්ඩලය

එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් මගින් හදුන්වාදී ඇති ඉතුරුම් ක්‍රම වූ "යාළු"ළමා ඉතුරුම් ගිණුම මියුලැසි කාන්තා ඉතුරුම් ගිණුම සහ ප්‍රයිම් ඉතුරුම් ගිණුම යන ගිණුම් ක්‍රම සියල්ලත් අපේ ශාඛාවෙහි ක්‍රියාත්මකයි. සාමාජිකාවන් ගේ එදිනෙදා අවශ්‍යතා සදහා ක්ෂණිකව ලබාදෙන "සහන ණය " ණය ක්‍රමය යටතේ අපේ සාමාජිකාවන්ගේ දූ දරුවන්ගෙ අධ්‍යාපනික අවශ්‍යතා එදිනෙදා වියදම් ආදියට යම් පිළිසරණක් වීමට අපි කටයුතු කරනවා.මේ යටතේ පසුගිය කාලය තුළ රු මිලියන 62 ක් සාමාජිකාවන් අතරේ සහන ණය වශයෙන් අපි ලබාදුන්නා. සාමාජිකාවන්ගේ සහ ඔවුන්ගේ පවුලේ උදවිය වෙනුවෙන් සලසා ඇති සාමාජිකාව සහ ණය ආරක්ෂණ අරමුදල යටතේ සාමාජිකාවන් 40 දෙනකු සඳහා මරණාධාර සහ වන්දි මුදල් වශයෙන් රුපියල් 986190 මුදලක් ලබාදීමට පසුගිය කාලය තුළ අපි කටයුතු කළා.

ව්‍යාපාර කිරීම සඳහා අවශ්‍ය ණය මුදල් නිකුත් කිරීමට අමතරව අපි අපේ සාමාජිකාවන් සඳහා හොඳ සේවාවක් ලබාදීමට නිරතුරුව කටයුතු කරනවා. නිදසුනක් විදිහට ගත්තොත් අපේ සාමාජිකාවන් සඳහා විවිධ වැඩමුළු සහ ව්‍යාපාරික උපදේශන සේවා ක්‍රියාත්මක කරනවා. ඒ යටතේ පසුගිය කාලය තුළ සෑම සතියකම මධ්‍යස්ථානයන්හිදී ව්‍යාපාරයන්ට අදාල මාතෘකාවක් සාකච්ඡා කරනවා. ඒ වගේම මධ්‍යස්ථාන නායිකාවන් 170 සඳහා සෙන්ටර් ලීඩර් ප්‍රෝගෑම් එකක් අපි ඔවුන් වෙනුවෙන් සංවිධානය කළා. ඊට අමතරව සමාජ සත්කාරක සේවාවන්ට මුල්තැනක් දී කටයුතු කිරීමට පසුගිය කාලය තුළ අපට හැකියාව ලැබුණා.මූල්‍ය ක්ෂේත්‍රය තුළ දිනෙන් දින සිදුවන වෙනස් කම් සැලකිල්ලට ගනිමින් වඩාත් විශ්වසනීයවූත් කාර්යක්ෂම සේවාවක් අප ගනුදෙනුකරුවන් වෙත ලබාදීමට නිරතුරුව අප කටයුතු කරනවා.

අද වෙනකොට හැටන් නැෂනල් බැංකුවට අනුබද්ධ මූල්‍ය ආයතනයක් විදිහට පෙරට වැඩි මූල්‍ය සේවාවන් රැසක් හඳුන්වාදීමට ප්‍රයිම් ග්‍රාමීන් සමාගමට හැකිවෙලා තියෙනවා.විශේෂයෙන් සුළු පරිමාණයේ ව්‍යාපාරකයින් සඳහා නවතම මූල්‍ය සේවා රැසක් ඔවුන්ගේ අවශ්‍යතාවයට සරිලන විදිහට හඳුන්වාදීමට අපට හැකිවුණා. එම ණය ක්‍රම සඳහා අද්වනවිට හොඳ පිළිගැනීමක් ව්‍යාපාරකයින් තුළ ඇතිවී තිබීම සතුටට කාරණයක්.සාමාන්‍ය ව්‍යාපාරකයින්ට වගේම අපගේ සාමාජිකාවන්ටත් වඩාත් පහසු සහ සාධාරණ මූල්‍ය සේවා සැපයීම තුළින් අපගේ රට තුළ ආර්ථික සමෘද්ධියක් ඇතිකරලීමේ ග්‍රාමීන් වෑයමට වාරුවක් වීමයි අපගේ ඒකායන බලාපොරොත්තුව.

**එච් එන් බී ග්‍රාමීන්**
**ෆිනෑන්ස් ලිමිටඩ්**
**අංක 677**
**විලියම් ගොපල්ලව මාවත,**
**මහනුවර**
**දුරː 0812217444**
**ඊ මේල්**
kandy@primegrameen.lk

## කවරයේ කතාව

# අපේ තෝරාගැනීම ඇත්තෙන්ම නිවැරදියි.....



විනෝද සවාරියකදී හෝ සාජ්ජයකදී නැතිවම බැරි සංගීත භාණ්ඩයක් ලෙස කොංගෝ නොහොත් බොංගෝ හැදින්වීමේ වරදක් නෑ.දකුණු අප්‍රිකානු සංගීත භාණ්ඩයක් ලෙස මෙරටට සංක්‍රමණය වූ මෙම අපූර්ව සංගීත භාණ්ඩය අද අපේ රටේ දේශීයවද නිෂ්පාදනය කෙරෙනු දැකිය හැකියි. එවන් එක් ස්ථානයක් මහනුවර සුදුහුම්පොළ පසුකරගෙන යන කාහට වුව දැකිය හැකි වන්නේ එය පාර අද්දරට වන්නට පිහිටා ඇති බැවිනි.ඒ දෙස බලමින් එම මගෙහි යන එන්නවුන් මෙන් එම ස්ථානය පසුකොට අපට යාමට නොහැකි වූයේ එම ආයතනයෙහි හිමිකාරිණිය එච් එන් බී ග්‍රාමීන් සාමාජිකාවක වන බැව් අප මහනුවර ශාඛාවෙහි ශාඛා කළමනාකරු ප්‍රකාශ කළ හෙයිනි. අපි ඇගේ ව්‍යාපාරික ස්ථානයට ගොඩවූයේ ඇගේ ව්‍යාපාරික තොරතුරු බිඳක් දැනගනු රිසියෙනි.

අවුරුදු 44 විතර කාලයක් පුරා අපි කරන්නේ මේ ව්‍යාපාරය. මේ හරියෙම මේ ව්‍යාපාරය කරන අය ඉන්නේ අපි දෙගොල්ලක් විතරයි. ඒ නිසාම ලංකාවේ විවිධ පළාත් වලින් තොග වෙළෙන්දො ඇවිත් අපෙන් බඩු ගෙනියනවා. කොංගෝ, ජල්බට්, පහන් තැටි, දුම් කබල්, ට්‍රන්කා පෙට්ටි, වගේ නිෂ්පාදන ගණනාවක්ම අපි නිෂ්පාදනය කරනවා.මේ ව්‍යාපාරය කරගෙන යද්දි අවශ්‍ය කළමනා ගන්න මුදල් අවශ්‍ය වෙනවා. ඒ සඳහා අපි තෝරාගත්ත මූල්‍ය ආයතනය තමයි එච් එන් බී ග්‍රාමීන්. අපේ ඒ තෝරාගැනීම ඇත්තෙන්ම නිවැරදි එකක් කියලා අපි කියන්නේ ඉතා සතුටින්. කොච්චර මූල්‍ය ආයතන තිබුණත් ඒ බොහොමයක දකින්න නැති හිතවත්කම, කඩිනම් ණය පහසුකම් සැපයීම, අසරණ වුණු වෙලාවට පිහිට වීම කියන කාරණා අතින් ප්‍රයිම් ග්‍රාමීන් සමාගම ඉන්නේ බොහොම ඉදිරියෙන්.

**එස්.එල්. ඉන්ද්‍රාවතී**
**විලියම් ගොපල්ලව මාවත,**
**සුදුහුම්පොළ, මහනුවර**

**ධනය බදා ගැනීමට පෙර සතුට බදා ගැනීම වැදගත් වේ.**

# ඔබ (නො)දන්න මම



සම්පූර්න නම :- දිසානායක මුදියන්සේලාගේ සුදත් අසංක විමලසූරිය

උපන් දිනය (කැමති නම්) :- 1982.02.02

පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල :- මම හෝඩියේ ඉඳලා උසස්පෙළ පංතියට වෙනකම් ගියේ මාතලේ විජය ජාතික විද්‍යාලයට. මගේ අම්මයි තාත්තයි ඉගෙන ගෙන තිබුණොත් ඒ පාසැලේමයි.පාසැලේ පහසුකම් වලින් අඩුවක් නොතිබුණු නිසා මට වෙන පාසැලකට යන්න උවමනා වුණේ නෑ. මම ක්‍රීඩා කළා. පාසැල් කෙඩෙට් තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයෙක් විදිහටත් කටයුතු කළා.

විෂය :- චිත්‍ර විෂයට පොඩිකාලේ ඉඳලා ලොකු කැමැත්තක් තිබුණා.

ක්‍රීඩාව :- හොකී, හය වසරේ ඉඳලා දහය වසර වෙනකම් පාසැල් හොකී කණ්ඩායමට මම ක්‍රීඩා කළා.පාසැල් මට්ටමින් ජයග්‍රාහන ලබාගන්නත් අපිට පුළුවන් වුණා.

පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ :- රැකියාව මේකයි කියලා කියන්න අදහසක් නොතිබුණත් කවදාහරි ලොකුවෙලා ටයි එකක් දාගෙන ලොකු පුටුවක ඉඳගෙන කරන රැකියාවක් ගැන මගේ හිතේ හීනයක් තිබුණා....මට හිතෙනවා මගේ ඒ හීනේ අද හැබෑවෙලා කියලා.

මුල්ම ජොබ් එක හොයාගන්න වින්ද දුක :- උසස් පෙළ විභාගෙ ලියලා නිකං ගෙදර ඉන්න කම්මැලිකමට මම සෙලින්කෝ සාමාන්‍ය රක්ෂණ සමාගමේ පුහුණුවන නිළධාරියෙක් විදිහට සේවයට බැඳුණා. මාස හතරකට පස්සේ ඔවුන් මට කරන්න ටාගට් එකක් ලබා දුන්නා.මම ඒ ටාගට් එක හිතුවටත් වඩා හොඳට කළ නිසා මාව සේවයේ ස්ථිර කරන්න ඔවුන් තීරණය කළා. ඔය අතරෙ තමයි 2003 අවුරුද්දෙ මාතලේ ග්‍රාමීන් ශාඛාවක් පටන් ගන්න යනවා කියන ආරංචිය මට ලැබුණේ. ජොබ් එකට ඇප්ලිකේෂන් දාලා ඉන්ටර්වීව් එකට කැඳවීම ආවා. ඉන්ටර්වීව් එක තිබුණෙ කිරුළපණ,... උදේ 8.00 ට. එතකොට කොළඹ දන්නෑ. උදේ 8.00 ඉඳන් තැන හොයා ගන්න එහාටයි මෙහාටයි ඇවිදලා යාන්තම් තැන හොයාගන්න කොට වෙලාව උදේ 11.30 යි. ඉන්ටර්වීව් එකෙන් පස්සෙ මුලින්ම පුහුණුවට දැම්මේ මොරටුවට. පුහුණුවෙන් පස්සේ මුල්ම පත්වීම මාතලේට. ක්ෂේත්‍ර කළමනාකරු විදිහට.

ග්‍රාමීන් ජීවිතේ අමතක නොවන සිද්ධිය :- ඒ සිද්ධිය වුණේ 2004 දි. එතකොට ග්‍රාමීන් වාසනා කියලා ලොතරැයි දිනුම් ඇදීමක් පැවැත්වුණා. සාමාජිකාවො විශාල සංඛ්‍යාවක් සහභාගි වෙන ඒ ලොතරැයි දිනුම් ඇදීම පැවැත්වෙමින් තියෙන මොහොතක එකපාරටම හෝල් එකේ ලයිට් ගියා. දැන් කර කියාගන්න දෙයක් නෑ... ජෙනරේටර් එකක්වත් අහල පහලක නෑ. ඒ ගමන ක්ෂණිකව ක්‍රියාත්මක වෙලා වෑන් එකක ගිහින් ජෙනරේටරයක් හොයාගෙන ඇවිත් පවර් සප්ලයි එක දුන්නා. ඒකේ අමතක නොවෙන සිද්ධිය වෙන්නේ වෑන් එකේ පිටිපස්සෙ එක අතකින් එල්ලීගෙන අනිත් අතින් අර තඩි ජෙනරේටර් එක ඇදගෙන ආපු මාරාන්තික ගමනයි. අපි කරපු වැඩේ ගැන හැමෝටම පුදුමයි. හැබැයි මට නම් ඒක මතක් වෙද්දිත් තවමත් අත රිදෙනවා රිදෙනවා වගෙයි.

ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය :- 2013 ජුනි මාසේ මම මගේ නමටම කාර් එකක් ගත්තා. ඒකත් අර පොඩි කාලේ ඉඳන් දැකපු හීන අතර තිබුණු එකක්. දුකට පත්වුණු සිද්ධීන් අතරෙ වඩාත්ම හිතට දැනෙන සිද්ධිය වෙන්නේ මගේ තාත්තගෙ මරණය. ඒ 2014 දි. මාස හයක් විතර තාත්තා කන්න බොන්න බැරි තරමෙ අසාධ්‍ය තත්වයක හිටියෙ. අපේ ප්‍රධාන කාර්යාලයේ රැස්වීමකට කොළඹ ඇවිත් හිටිය වෙලාවක තමයි මට තාත්තගෙ මරණය ගැන ආරංචිය දැන ගන්න ලැබුණෙ. එදා මට දැණුනේ මගේ ජීවිතේට මඟ පෙන්නපු මට හිටිය හොඳම ගුරුවරයා මිතුරා මට අහිමි වුණා කියන හැඟීමයි.

අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට



## ටයි එකක් දාගෙන ලොකු පුටුවක ඉඳගෙන කරන රැකියාවක් ගැන මගේ හිතේ හීනයක් තිබුණා....

**සුදත් අසංක විමලසූරිය**
**ප්‍රාදේශීය කළමනාකරු නුවර ප්‍රාදේශිකය**

සටහන
මංජුල හෙට්ටිආරච්චි

**වගකීම් භාර ගැනීම් මෙන්ම ඒවා උසස් මට්ටමින් ඉටු කිරිමද වැදගත්ය.**



**හේතුව :-** මගේ පාසැල් කාලයට යන්න තමයි කැමැති. මගේ පාසැල් කාලේ මම වැඩිපුරම ගත කළේ ගෙදරින් පිට ආච්චිලගේ ගෙදර.මොකද අපේ අම්මා විටින් විට රට රැකියාවන්ට ගියා. මේ නිසා පොඩි කාලේ ඉගෙන ගැනීමට අපිව පොළඹවන්න පෙරැත්ත කරන්න කෙනෙක් හිටියේ නෑ. ඉගෙන ගැනීමේ වටිනාකම ඒ නිසා අපිට තේරුණේ නෑ. ආපහු පාසැල් අවධියට යන්න පුළුවන් නම් ඒ වැරැද්ද නිවැරදි කරගෙන ජීවිතේ මීට වඩා සාර්ථක කරගන්න හැකිවේවි.

**හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා :-** මම වැරැද්දක් වෙනවට බයයි. හැම තිස්සෙම මම හිතන්නේ මගේ ළඟ ඉන්න අය හොඳින් ඉන්න ඕන කියලයි. මම මගේ කටයුතු කරන්නේ ඒ හැඟීමෙන් ඒත්.. ඒක නිසා මම හුඟක් පාඩු කරගත්ත දුෂ්කරතාවන්ට මුහුණ දුන්න අවස්ථා වැඩියි.හැබැයි තවමත් මම ඒ වැරැද්ද හරි ගස්සගෙන නෑ.

**ඔබ දකින ඔබේ චරිතයේ සුවිශේෂී ගුණාංගය :-** මම පුළුවන් තරම් හැමෝටම එක විදිහට සලකන්න උත්සාහ කරන කෙනෙක්. ඒ වගේම මොන ප්‍රශ්නෙ ආවත් ඒක සතුටින් බාර ගන්න උත්සාහ කරනවා.

**ඔබේ ජීවිතයට බලපෑ පූර්වාදර්ශී පුද්ගලයකු සිටී නම් ඔහු හෝ ඇය :-** මගේ අම්මයි තාත්තයි. ඒ අය ජීවිතෙන් අපිට දුන්නු ආදර්ශ බොහොමයි. දවසින් දවස වැඩෙද්දි පාඩම් පොතක පෙරලෙන පිටු වගේ ඔවුන්ගේ ජීවන අත්දැකීම් අපට උකහා ගන්න ලැබුණා.

**පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම :** -ඉස්කෝලෙ 10 වසරෙ ඉන්දැද්දි පහල පංතියක ගෑණු ළමයෙක් මට ලියුමක් දුන්නා. ඇය මේ ලියුම මට දුන්නා කියලා අපේ පංති භාර ගුරුවරියට දැන ගන්න ලැබුණු බව මට දැන ගන්න ලැබුණා. මම කළේ ඒ ළමයා මට දුන්නු ලියුම විදිහට වෙන ලියුමක් හදලා ටීචර් මගෙන් ලියුම ඉල්ලුවම ඒක දුන්නා. ඒ ලියුම මම ලිව්වෙ ඒ ළමයා මට බැනලා එව්ව ලියුමක් විදිහට. ඒකෙන් ඒ ප්‍රශ්නෙ එහෙම්මම යට ගියා. ඉන් පස්සෙ මමත් ඒ ගැන දිගට හිතුවෙ නෑ. හැඟීමක් ඇතිව මම කරපු පළමු ආදරය කෙළවර වුණේ විවාහයෙන්. එයා නෙත්මි හේරත්.

**එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව :-** ඇයගේ ගතිගුණ වලටයි මම වඩාත් කැමැති වුණේ. ලස්සනටත් ඉන්නවා...අපිට පුතෙක් ඉන්නවා. පුතාට දැන් අවුරුදු 10 වෙනවා.

**ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂය (terning Point):-** මම සෙලින්කෝ රක්ෂණ සමාගමේ පුහුණු වෙන කාලයේම පොලිසියටත් ඇප්ලිකේෂන් එකක් දාලයි තිබුණේ. එතකොට මාතලේ හිටපු නගරාධිපතිතුමාවත් මම ටිකක් දන්නවා. ඔහු මාර්ගයෙන් ජෝන් අමරතුංග මහත්තයව හම්බවෙලා පොලිසියේ SI යන්න හදාගත්තා. ඒ පත්වීමේ ලියුමයි ග්‍රාමින් එකේ පත්වීමේ ලියුමයි දෙකම මට ලැබුණෙ එකට. මොන හේතුවකටද මන්දා මම තෝරා ගත්තේ පොලිසිය නෙවෙයි. ග්‍රාමින් එකේ රස්සාව. ඒක නිසා අද වෙනකොට හුඟක් දුප්පත් මිනිස්සුන්ට උදව් කරන්න මට පුළුවන් වෙලා තියෙනවා. ග්‍රාමින් එක හරහා ගෙවල් නැති දුප්පත් මිනිස්සු දොළහකට විතර ගෙවල් හදාගන්න උදව් කරන්න මට පුළුවන් වුණා. සරණ අරමුදලෙන් වගේම මෙහෙවර අරමුදල මාර්ගයෙනුත් අසරණ තත්වයට පත්වුණු රෝගීන් විශාල සංඛ්‍යාවකට ඔවුන්ගේ සැත්කම් සඳහා අරමුදල් සපයා දෙන්න මූලික වුණා අපේ ජීවිත සතුටින් ගෙවනවා වගේම සමාජයටත් විශාල යුතුකම් ප්‍රමාණයක් ඉටු කරන්න මට පුළුවන් වුණේ එදා ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වෙන්න මම ගත්තු තීරණය නිසයි.

**ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද :-** නැතුව... මනුෂ්‍යයෙක් විදිහට සමාජයේ පිළිගැනීමක් ඇතිව කාටවත් බරක් නොවී ජීවත් වෙන්න පුළුවන් නම් ඊට වඩා මොනවද

**ඔබේ ප්‍රියතම ගායකයා :-** ගුණදාස කපුගේ

**ගීතය :-** දවසක් පැළ නැති හේනේ

**චිත්‍රපටිය :-** රැම්බෝ

**කෘතිය :-** මොහොමඩ් යූනුස් මහත්තයාගේ දුප්පතුන්ගෙ බැංකුව පොත ඒක රැකියා ජීවිතයට හුඟක් සම්බන්ධයි.

**අනාගත ඉලක්කය :-** කාටවත් බරක් නොවී සමාජයටත් යහපතක් වෙන විදිහට ජීවත් වීම. රැකියාවෙන් විශ්‍රාම ගත්තට පස්සේ මගේම කියලා පුංචි ව්‍යාපාරයක් කරන්න බලාපොරොත්තුවක් තියෙනවා❑



## තුෂාර - තිළිණි යුවලට සුබ මංගලම්





එච් එන් බී ග්‍රාමින් ෆිනෑන්ස් ලිමිටඩ්හි හොරණ ශාඛාවේ සහකාර කළමනාකරු වූ තිලංක තුෂාර රත්නායක මහතා පසුගිය දා නව යුගදිවි ගමන් ඇරඹීය. ඔහුගේ අතගත් මනාලිය වූයේ තිළිණි මධුශාන්ති මෙනෙවියය. එච් එන් බී ග්‍රාමින් ෆිනෑන්ස් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු කාර්ය මණ්ඩලයේ උණුසුම් සුබ ප්‍රාර්ථනා තිලංක තිළිණි යුවල වෙත මෙසේ පිළිගන්වමු...

**පරාජයට / වරදිනවාට / ආසාර්ථකවනවාට බිය වන්නේ ආත්ම විශ්වාසය අඩුවිටයි.**

# micro credit සංකල්පය පිළිබඳ සරල කියැවීමක්

## මයික්‍රෝ ක්‍රෙඩිට් ක්‍රමවේදයේ ආරම්භය හා විකාශනය. - 7 කොටස



එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.

# ණය චක්‍රය

කිසියම් ගනුදෙනුකරුවකු ණය මුදලක් ඉල්ලා සිටීමේ සිට එම ණය මුදල ලබාගැනීම, නැවත ආපසු ගෙවීම දක්වා වූ ක්‍රියාවලිය මතුපිටින් පෙනෙන තරමේ සරළ හා සුගම වූවක් නොවේ. ණය ඉල්ලුම් කිරීමේ සිට ණය නැවත ගෙවා නිම කිරීම දක්වා අතරතුර වූ තවත් අවස්ථා කිහිපයක් වෙයි. එකිනෙක හා බැඳි චක්‍රයක් සේ ගමන්කරන මේ ක්‍රියාදාමය ණය චක්‍රය ලෙස හැදින්වේ. එම පියවරයන් එකිනෙක පෙළ ගැස්වූ විට අපට මෙවැනි අවස්ථාවන් හයක් හමුවේ.

1. ඉල්ලුම් කිරීම.
2. විශ්ලේෂණය
3. තීරණය
4. පරිපාලනය
5. නිරීක්ෂණය
6. ණයවල ඇති ප්‍රශ්න කළමනාකරණය කිරීම (පහත 01 රූප සටහන)

මෙම ණය චක්‍රය පිළිබඳව එකිනෙක හඳුනාගැනීමට පෙර ණය ලබාදීම තුළ වූ සංකීර්ණතාවය හඳුනාගැනීමට ඉවහල් වන නිදසුන් කතාවක් මෙසේ ගෙනහැර දැක්විය හැකියි.

කමලා ගම්බදව ජීවත් වූ කාන්තාවක්. ඇයට ඇයගේ මිතුරියකගේ ණය මුදලක් ගෙවා දැමීම සඳහා ගමේ මුදල් පොලියට දෙන්නෙකුගෙන් ණය මුදලක් ලබා ගැනීමට සිදුවේ. සැමියාට නොදන්වා කමලා මේ ගනුදෙනුව සිදුකළද කෙසේ හෝ සැමියාට ඇගේ ගනුදෙනුව පිළිබඳ තොරතුරු අනාවරණය වෙයි. කමලාගෙන් මේ පිළිබඳ විමසන සැමියා ඇයට අවවාද කරන්නේ ණය මුදලක් ගැනීමට අවශ්‍ය නම් මෙසේ මුදල් පොලියට දෙන්නන්ගෙන් ණය ලබා නොගෙන බැංකුවකින් ණය ලබා ගැනීමට කටයුතු කරන ලෙසයි. ඉක්බිති කමලා නගරයේ බැංකුවක් වෙත ගොස් ණය මුදලක් ඉල්ලා සිටින්නේ සැමියාගේ උපදෙස් අකුරට පිළිපදිමිනි. බැංකුව වෙත යන කමලා ණය මුදල් නිකුත් කරන නිලධාරියා හමුවී තමාට ණය මුදලක් අවශ්‍ය බව පවසයි. මින් පෙර ණය මුදල් ලබාගෙන තිබේද යනුවෙන් නිලධාරියා අසන ප්‍රශ්නයට කමලා දුන් පිළිතුර වනුයේ නැතිය යන්නයි. ඇය තමා ගමේ ණය ලබාදෙන්නාගෙන් මුදල් ලබාගත් බව නිලධාරියාගෙන් වසන් කිරීමට ප්‍රවේශම් වෙයි. ණයක් අවශ්‍ය වන්නේ කුමකටද යන නිලධාරියාගේ ප්‍රශ්නයට කමලා දුන් පිළිතුර වූයේ කිරි එලදෙනක මිළදී ගැනීම සඳහාය යන්නයි. කමලාගේ පිළිතුරින් සෑහීමකට පත්වන නිලධාරියා කමලාට පවසා සිටිනුයේ තම මූල්‍ය ආයතනයේ මේ සඳහා කෙටි කාලීන හා දිගු කාලීන වශයෙන් ණය මුදල් දෙකක් ඇති බවත් කමලාගේ අවශ්‍යතාව සඳහා කෙටිකාලීන ණය මුදලක් ප්‍රමාණවත් බවත් ලබා දිය හැකි ණය මුදල රු. 10,000 බවත් එය වසරකින් ගෙවා නිමකළ යුතු බවත්ය. කමලාගේ එකගතාවය මත නිලධාරියා ඇයට ණය ඉල්ලුම්පත ලබාදීමෙන් පසු දිනෙක තමා කමලාගේ නිවසට පැමිණ ඇයගේ ව්‍යාපාරය පිළිබදව සොයා බලා තොරතුරු ගොනුකොට එය ණය කමිටුවට ඉදිරිපත් කරන බවත් ණය මුදල ලබාදෙන්නේද නැද්ද යන්න තීරණය කරන්නේ එම ණය කමිටුව බවත්ය. ණය කමිටුව යන්න කුමක්ද කියාවත් නොදන්නා කමලා සිතන්නේ නිසැකයෙන්ම එහි තමන් දන්නා කවුරුන් හෝ සිටිනවා විය හැකියි කියාය. ඒ පිළිබදව තව දුරටත් තහවුරු කරගැනීමට ඇය නිලධාරියාගෙන් ණය කමිටුවේ සිටින්නේ කවුරුන්ද යන්න විමසා සිටී. නිළධාරියා පවසන තොරතුරු වලින් ණය කමිටුවේ තමන් දන්නා කිසිවකුත් නැතිබව තහවුරු කරගන්නා කමලාගේ සිතෙහි ඇතිවන ගැටලුව වන්නේ කිසිදා තමන් දැක නැති තමන් පිළිබදව නොදන්නා නිලධාරීන් පිරිසක් තමන්ට ණය මුදලක් ලබාදෙන්නේද නැද්ද යන්න තීරණය කරන්නේ කෙසේද යන්නයි.

මේ නිදසුන් කතාවෙන් ණය ලබාගැනීම හා ණය ලබාදීම පිළිබඳ විෂයෙහි වූ සංකීර්ණතාව මැනවින් පසක් වනු ඇත. සැබැවින්ම ණය මුදලක් ලබාදීමේදී ණය මුදල ලබාදෙන්නා හා ණය මුදල ලබාගන්නා අතර වූ විනිවිදභාවය කොතෙක්ද- ණය ලබාදෙන ආයතනයෙහි කොන්දේසි, එහි පොළී අනුපාතයන් කොතෙක් දුරට ණය ලබාදෙන්නා විසින් ණය ලබාගන්නා තැනැත්තාට හෙළිකරන්නේද.... ණය ලබාගන්නා පුද්ගලයා තමා පිළිබදව හා තමා ණය ලබාගන්නා කාරණය පිළිබදව කොතෙක් දුරට සත්‍ය කරුණු ණය ලබාදෙන ආයතනය වෙත හෙළි කරන්නේද.... මේ දෙපාර්ශවය අතරවූ අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය ණය චක්‍රය සම්පූර්ණ කිරීමේදී අනිවාර්ය වන හේතු සාධකයන් වේ. ණය චක්‍රයට ඇතුලත් වන කරුණු හය පිළිබදව විස්තරාත්මකව අපි මෙහෙවර ලබන කලාපයෙන් කියවමු.




(01 රූප සටහන)

## ප්‍රයිම් ග්‍රාමීන්.., එච් එන් බී ග්‍රාමීන් නමින් දොරට වඩියි...

ප්‍රයිම්ග්‍රාමීන් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම පසුගිය ජූලි 17 වන දින ප්‍රයිම් ග්‍රාමීන් ශ්‍රවනාගාරයේදී පැවත්විණි. ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ සභාපති ජොනතන් අලස් මහතා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගීත්වයෙන් පැවති මෙම මහා සභා රැස්වීමෙහි සුවිශේෂීත්වයක් වූයේ මෙතෙක් ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් නමින් පැවති සමාගම එච් එන් බී බැංකුව සමග ඒකාබද්ධ වී මෙදින සිට එච් එන් බී ග්‍රාමීන් ෆයිනෑන්ස් ලිමිටඩ් ලෙස වඩාත් ශක්තිමත් මූල්‍ය සමාගමක් ලෙස සිය සේවා ව්‍යාප්ත කරලීම ඇරඹීමයි.





ඔබ අන් අයට සැලකිල්ලක් නොදක්වන විට, ඒ අය ඔබට සැලකිල්ලක් නොදක්වයි.

## HNB GRAMEEN Diary

**2015 ජුනි**

**එච් එන් බී ග්‍රාමීන් අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් පත්වෙති.**

2015 ජුනි මාසයේ සිට බල පැවැත්වෙන පරිදි එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලයට නව ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් ලෙස ආචාර්ය එස්.යූ.එච්.ප්‍රනාන්දු සහ ජී.එස් විජේසිංහ යන මහත්වරු පත්වූහ.

**03.06.2015**

**එච් එන් බී ග්‍රාමීන් කළුතර ශාඛාවෙන් අයිස්ක්‍රීම් දන්සැලක්**



එච් එන් බී ග්‍රාමීන් කළුතර ශාඛාවේ කාර්ය මණ්ඩලය විසින් සංවිධානය කරන ලද අයිස්ක්‍රීම් දන්සැලක් ජුනි මස 03 වෙනිදින සවස 4.00 සිට කළුතර ශාඛාව ඉදිරිපිටදී පවත්වන ලදි.

**29.06.2015**

**ප්‍රයිම් ග්‍රාමීන් සිව් වර්ෂ පූර්ණය දා....**







ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ සිව් වර්ෂ පූර්ණය සමරා ජුනි මස 29 වන දින දිවයිනේ දසත විහිදුණු ප්‍රයිම් ග්‍රාමීන් ශාඛාවන්හි සහ ප්‍රධාන කාර්යාලයේ විවිධ ආශීර්වාදාත්මක ආගමික කටයුතු සංවිධානය කර තිබෙනු දක්නට ලැබිණි.

එම අවස්ථාවන් අතරින් ප්‍රධාන කාර්යාලයේ සහ කළුතර, වත්තල ශාඛාවන්හි සංවිධානය කරන ලද සැමරුම් අවස්ථාවන්හි ඡායාරූප මෙසේය.

**30.06.2015**

**බදුල්ල ප්‍රාදේශිකයෙහි ක්‍රිකට් ජය වැලිමඩට**



එච්.එන්.බී. ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි සේවක සුබ සාධක සංගමය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සය සාමාජික ක්‍රිකට් තරඟාවලියෙහි ප්‍රාදේශීය කණ්ඩායම් තරඟ පසුගිය දිනයන්හිදී පැවැත්වුණා.එහිදී බදුල්ල ප්‍රාදේශිකයෙහි ජය හිමිකරගත් එච්.එන්.බී. ග්‍රාමීන් වැලිමඩ ක්‍රිකට් කණ්ඩායම සිය ජයග්‍රාහනය සමරමින් සමූහ ඡායාරූපයකට පෙනී සිටියේ මෙසේය.

## HNB GRAMEEN "මෙහෙවර" සත්කාර අරමුදලින් පිළිසරණ ලැබූවෝ...

මුදල් ගනුදෙනු , ලාභ පාඩු , මේ වගේ වචන ව්‍යාපාරික ශබ්දකෝෂයක නිරන්තරයෙන් එහා මෙහා පාවෙන වචන . ව්‍යාපාරයක පැවැත්මට, එහෙමත් නැත්නම් දෛනික ක්‍රියාවලියේදී මේ වචන අනිවාර්ය වෙද්දී මේ වචන වලින් එහාට යමින් තම ගනුදෙනුකරුවාගේ සමාජ ස්වාවරභාවය ගැන වගේම සුබ සාධනය පිළිබඳවත් යම් සැලකිල්ලක් දක්වන්නට කිසියම් ආයතනයකට හැකිනම්... මිනිසුන් අසරණ වන්නේ කොයි මොහොතක කෙසේදැයි අප කාහට නම් කිව හැකිද...එවන් මොහොතක ඒ අසරණ මිනිසුන්හට කිසියම් හෝ අන්දමකින් සරණ විය හැකිනම්....මෙහෙවර සත්කාර අරමුදල බිහිවන්නේ එවන් උදාර අරමුණක් පෙරදැරිවය.

ප්‍රයිම් ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබගේම ධන පරිත්‍යාගයෙන් ගොඩනැගුණු "මෙහෙවර" සත්කාර අරමුදලේ පිහිට පතමින් දිවයිනේ දසතින් අපවෙත ලැබෙන ඉල්ලීම් සිය ගණනක් අතරින් තෝරාගත් පිළිසරණ අපේක්ෂකයින් කිහිපදෙනෙකුට පසුගිය ජුනි මාසයේදීද රුපියල් එක්ලක්ෂ හැත්තෑදෙදහස් හත්සියයක මුදලක් (172,700/-) අපි ආධාර මුදල් ලෙස ලබාදීමට කටයුතු කළෙමු. එසේ මේ වනවිටත් ආධාර ලබාදී ඇති ආධාර ලාභීන් කිහිප දෙනකු පිළිබඳ තොරතුරු මෙසේය.

**01. පුත්තලම ශාඛාව**



සාමාජිකාව:- ආර්.සෙල්වි
ආධාර ලාභියා:- වී.ඩී. පිල්ලෙ (සැමියා)
ආධාර ලබාදීමට හේතුව:- ශල්‍යකර්මයකින් පාදයක් ඉවත් කිරීම නිසා රෝදපුටුවක් මිළදී ගැනීමට

**02. නාවලපිටිය ශාඛාව**



සාමාජිකාව:- පී.ජී.චමිලා
ආධාර ලාභියා:- පී.ජී.චමිලා (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුව:-දැඩි සුළඟින් සහ වර්ෂාවෙන් නිවසෙන් කොටසක් විනාශ වීම

**03. නිකවැරටිය ශාඛාව**



සාමාජිකාව:- ඩබ්.ඒ. චන්ද්‍රාවතී
ආධාර ලාභියා:- ඩබ්.ඒ. චන්ද්‍රාවතී (සාමාජිකාව) ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**04. නිකවැරටිය ශාඛාව**



සාමාජිකාව:- එන්.පී.එච්. චන්ද්‍රිකා
ආධාර ලාභියා:- එන්.පී.එච්. චන්ද්‍රිකා (සාමාජිකාව )
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**05. මීගමුව ශාඛාව**



සාමාජිකාව:- ජී.ඩී.එන්. නිරෝෂණී
ආධාර ලාභියා:- සී.හේරත් (සැමියා) ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**06. මීගමුව ශාඛාව**



සාමාජිකාව:- කේ.ලිලී මාග්‍රට්
ආධාර ලාභියා:- කේ.ලිලී මාග්‍රට් (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**07. වෙන්නප්පුව ශාඛාව**



සාමාජිකාව:- එම්.එම්. සමන්ති
ආධාර ලාභියා:- එම්.එම්. සමන්ති ( සාමාජිකාව )
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**08. මොරටුව ශාඛාව**



සාමාජිකාව:- පී.ඒ.රංජනී
ආධාර ලාභියා:- ඩබ්.ඒ. රවීන් (පුතා)
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**09. වැලිමඩ ශාඛාව**



සාමාජිකාව:- එච්.ඒ.එස් හිමාෂි
ආධාර ලාභියා:- එච්.ඒ.එස් හිමාෂි (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**10.වත්තල ශාඛාව**



සාමාජිකාව:- කේ. ඩී. මාරි
ආධාර ලාභියා:- කේ. ඩී. මාරි (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**11. ඇඹිලිපිටිය ශාඛාව**



සාමාජිකාව:- කේ.එස්. අනෝජා
ආධාර ලාභියා:- කේ.එස්. අනෝජා (සාමාජිකාව )
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා

**මෙහෙවර සත්කාර අරමුදල තව තවත් සාර්ථක කර ගැනීම සඳහා වූ ඔබගේ අදහස් සහ යෝජනා අප ඉතා අගය කරන අතර මේ සම්බන්ධයෙන් ඔබගේ අදහස් උදහස් 0710292018 යන දුරකථන අංකයෙන් සුදේශ් පෙරේරා මහතාට යොමු කරන්න.**

එච් එන් බී ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ සේවක සුබ සාධක සංගමය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සය සාමාජික ක්‍රිකට් තරගාවලියෙහි ප්‍රධාන කාර්යාලයේ තරග පසුගිය ජුනි මස 20 වෙනි දින දෙහිවල එස් ද එස් ජයසිංහ ක්‍රීඩාංගනයේදී පවත්වනු ලැබීය. තරගකාරී කණ්ඩායම් දහයක් තරග වැදුණු මෙම තරගාවලියෙහි ජයග්‍රාහී කණ්ඩායම ලෙස අභිසෙස් ලැබුවේ ගිණුම් අංශයේ කණ්ඩායමයි. අනු ශූරතාවය මෙහෙයුම් අංශය මගින් දිනාගත් අතර තරගාවලියෙහි උණුසුම් අවස්ථා මෙසේ අප කැමරා කාචයෙහි සටහන්ව තිබුණා.

ඡායා - පත්මකුමාර / සමින්ද





# මූල්‍ය සමාගම් ක්‍රීඩා සැනකෙලියේ "හොඳම නිර්මාණාත්මක කුටිය" එච්.එන්.බී.ග්‍රාමීන් වෙතින්

ද ෆයිනෑන්ෂියල් හවුස් ඔෆ් ශ්‍රී ලංකා මඟින් සංවිධානය කරන ලද අන්තර් මූල්‍ය සමාගම් ක්‍රීඩා සැනකෙලිය පසුගිය ජූලි මස 11 වන දින දවස පුරා කොළඹ බිලූම් ෆීල්ඩ් ක්‍රීඩාංගනයේදී උත්සවාකාරයෙන් පවත්වන ලදි.මෙම අවස්ථාව සඳහා ද ෆයිනෑන්ෂියල් හවුස් ඔෆ් ශ්‍රී ලංකා සංගමයේ සාමාජිකත්වය ලබාගත් මූල්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් සහභාගී විය.

ක්‍රිකට්,වොලිබෝල්,නෙට්බෝල්,රගර්,වැනි ක්‍රීඩා ඉසව් ගණනාවක් සහ මූල්‍ය සමාගම් කුමරිය (FHA queen) තේරීමේ තරගය,හොඳම නිර්මාණාත්මක කුටිය තේරීමේ තරගය වැනි විශේෂාංගයන්ගෙන්ද මෙම ක්‍රීඩා උළෙල වර්ණවත් විය. එච්.එන්.බී.ග්‍රාමීන් ෆයිනෑන්ස් සමාගම විසින් ඉදිකරන ලද කුටිය හොඳම නිර්මාණාත්මක කුටිය ලෙස ජයග්‍රහනය කිරීම විශේෂත්වයකි.මූල්‍ය සමාගම් අතර සහෝදරත්වය සහයෝගීතාවය අපේක්ෂාවෙන් සංවිධානය කළ මෙම ක්‍රීඩා සැනකෙලිය සාර්ථක කර ගැනීම සඳහා දායකත්වය දැක්වූ සියළුම දෙනා වෙත එච්.එන්.බී.ග්‍රාමීන් ෆයිනෑන්ස් සමාගම සිය ස්තූතිය පුදකරනු ලබන අතර ජයග්‍රාහනය ලැබූ සහෝදර තරගකරුවන් හා තරගකාරීයන් වෙත සුභාශිංෂණ මෙසේ පිළිගන්වයි.









# ව්‍යාපාරික කටයුතු හා බැඳි උපකාරක සේවා

18 කොටස

ආයතනයක හෝ සංවිධානයක කටයුතු සැලසුම් කිරීමේදී එය ඉදිරි කටයුතු වල ස්වභාවය අනුව විවිධ ස්වරූප ගනී. ඒ අනුව ඒවා පහත පරිද්දෙන් අපට වර්ග කොට දැක්විය හැකිය.

**01. පුළුල් බව අනුව** (Bredth)

- උපාය මාර්ගික සැලසුම් (Strategic Plan)

සමස්ථ සංවිධානය වෙනුවෙන් නැතහොත් සමස්ථ ඉලක්ක හා පරමාර්ථ ළඟා කරගැනීම සඳහා සකස් කළ සැලසුම් වේ. ඒවා ඉහල කළමනාකරුවන්ගේ මූලිකත්වයෙන් සැකසේ.

වසරකට වඩා දිගු කාලයක් ආවරනය කරයි. පුළුල් පරාසයක් මෙම සැලසුමට අදාලය. ඉලක්ක හා පරමාර්ථ තීරණය මෙම සැලසුමට ඇතුලත්ය.



## ආයතනයක ඉදිරිය තීරණය කරන සැලසුම් වර්ග (Types of Plan)

- මෙහෙයුම් සැලසුම් (Operational Plan)

ඉලක්ක හා පරමාර්ථ ළඟා කරගන්නා ආකාරය හෙවත් ක්‍රම පිළිබඳ නිශ්චිත වශයෙන් විස්තර කරන සැලසුම් වේ. මෙහෙයුම් කළමනාකරුවන් විසින් සකස් කෙරේ. කෙටිකාලයක් ආවරනය කෙරේ. සංවිධානයක මාසිකව, සතිපතා හා එදිනෙදා ක්‍රියාකාරකම් ඇතුලත් වන්නේ මෙහෙයුම් සැලැස්මේය. ඉලක්ක හා පරමාර්ථ ළඟා කර ගැනීමට ක්‍රියා කළයුතු ආකාරය මෙම සැළසුමෙන් පෙන්වයි.

**02. කාල රාමුව අනුව** (Time Frame)

- දිගු කාලීන සැලසුම් (Long Term Plan)

වසරකට වඩා වැඩි කාලයක් සඳහා වූ සැලසුම් දිගු කාලීන සැලසුම් ලෙස හඳුන්වයි.

- කෙටි කාලීන සැලසුම් (Short Term Plan)

වසරකට වඩා අඩු කාලයක් සඳහා වූ සැළසුම් කෙටි කාලීන සැලසුම් ලෙස හඳුන්වයි.

**03. නිශ්චිතතාව අනුව** (Specificity)

- උද්දේශිත සැළසුම් (Directional Plan)

සාමාන්‍ය හෙවත් පොදු මාර්ගෝපදේශන සහිත සැළසුම් වේ. මේවායේ ඉලක්ක තිබුනද ඒවා නිශ්චිතව සඳහන් ව නොමැත.

උදා :- ඉදිරි වර්ෂ 05ක් තුළ ආයතනයක් එහි විකිණුම් 10%- 25% දක්වා වැඩිකිරීමේ සැළසුම් උද්දේශිත සැළසුම් වේ.

- නිශ්චිත සැළසුම් (Specific Plan)

පරමාර්ථ නිශ්චිතව සඳහන් කරන සැළසුම් , නිශ්චිත සැළසුම්, ලෙස හැඳින්වේ. යම් කිසි ආයතනයක් ඉදිරි වර්ෂයේ විකුණුම් 25% කින් වැඩි කිරීමේ පරමාර්ථයක් සහිත සැළසුම් මීට උදාහරණ වේ.

**04. භාවිත පරාසය අනුව** (Frequency of Use)

- ඒකල භාවිත සැළසුම් (Single Use Plan)

එක් වරක් පමණක් භාවිතා කරන සැළසුම් ඒකල භාවිත සැළසුම් ලෙස හඳුන්වනු ලබයි. එනම් යම් විශේෂිත තත්වයකට මුහුණ දීම පමණක් සුවිශේෂ වශයෙන් සකස් කරන සැළසුම් වේ.

- ස්ථාවර භාවිත සැළසුම් (Standing Use Plan)

ආයතනයේ සමස්ථ කාර්ය සාධනය සඳහා මඟ පෙන්වීමට ක්‍රියාත්මකව පවත්නා සැළසුම් වේ. ඒවා නැවත භාවිතා වේ.

**05. සැළසුම් ක්‍රියාවලියේ අදියර / පියවර** (Steps in the Planning Process)

අනුව සැළසුම් කරන ක්‍රියාවලිය අදියර නවයකින් සමන්විත වේ.

1. ඉලක්ක ස්ථාපිත කිරීම (Goal Formulation)
2. පරමාර්ථ හා උපාය මාර්ග හඳුනාගැනීම (Identification of current objectives & Strategy)
3. පරිසර විශ්ලේෂණය (Environment Analysis)
4. සම්පත් විශ්ලේෂණය (Resources Analysis)
5. අවස්ථා හා තර්ජන හඳුනා ගැනීම
6. පරාසය විශ්ලේෂණය (Gap Analysis)
7. උපාය මාර්ගික තීරණ ගැනීම. (Strategic Decision Making)
8. උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම. (Strategic implementation)
9. සාර්ථකත්වය මැන බලීම හා පාලනය (Measurement and Control of Progress)



සඳකැලුම් ජයතුංග,
ගණකාධිකාරී,
ප්‍රයිම් ග්‍රාමීන්
මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්.



අසාර්ථක වීමට ප්‍රධාන හේතුව සැකය සහ අවිශ්වාසයයි.



## ඇප කරුවන් අවශ්‍ය නැති ලිහිල් පිළිවෙත අපි වගේ පුංචි ව්‍යාපාරකයින්ට විශාල සහනයක්.




පිළිමතලාව කවදත් ප්‍රසිද්ධ පිත්තල වලට. පිළිමතලාවෙ කිරිවවුලෙ පදිංචි සීතා හාමිනේගේ ස්වාමියත් පාරම්පරිකව පැවත එන පිත්තල වැඩකරුවන්ගේ තවත් එක් පුරුකක්. සීතා හාමිනේ සිය ව්‍යාපාරික ජීවිතය හා ප්‍රයිම් ග්‍රාමීන් සමාගමෙන් ඇයට ලැබුණු අත්වැල ගැන අපිට කිව්වේ මෙහෙමයි.

අපි පිත්තල උණුකිරීමේ ඉඳලා සෑම මට්ටමකම පිත්තල වැඩ මෙතැන කරනවා. පිත්තල පහන්, මල්පෝච්චි, පාත්තර ආදී සෑම නිෂ්පාදනයක්ම කරනවා. මහනුවර ඉඳලා කොළඹ කතරගම දක්වාම අපේ නිෂ්පාදන තමයි වැඩිපුර යන්නේ. මේ වැඩ කටයුතු සඳහා මම ගාව හය දෙනෙක් විතර වැඩ කරනවා. ඇනවුම් වැඩි කාල වලට 20-30 විතරත් අපි ළඟ වැඩ කරන වෙලාවල් තියෙනවා. මේ ව්‍යාපාරය කරද්දි නිතර මුදල් අවශ්‍යතා ඇතිවෙනවා. ඒ වගේ වෙලාවට ඉක්මණින් සහ පහසුවෙන් ණය මුදලක් ගන්න පුළුවන් තැනක් තියෙනවා නම් ඒක ලොකු අස්වැසිල්ලක්. මොකද හුඟක් බැංකු ණය මුදලක් ලබාදීමේදී ඇප වත්කම් හොයා බලනවා. ඒ වගේ තත්වයක් තියෙද්දි ප්‍රයිම් ග්‍රාමීන් සමාගම ණය මුදලක් ලබාදීමේදී අනුගමනය කරන ඇප කරුවන් අවශ්‍ය නැති ලිහිල් පිළිවෙත අපි වගේ පුංචි ව්‍යාපාරකයින්ට විශාල සහනයක්. මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුණේ 2004 අවුරුද්දෙදි . එදා ඉඳන් අද වෙනකනුත් මගේ ව්‍යාපාරයේ සෑම මුදල් අවශ්‍යතාවක්ම මම සපුරා ගන්නේ ප්‍රයිම් ග්‍රාමීන් සමාගමෙන්.

**එස්.ඒ සීතා හාමිනේ - කිරිවවුල, පිළිමතලාව**

## "පෙර හුරුපුරුදු හිතවත්කමෙන් සහ එච් එන් බී එකමුතුවේ ශක්තියෙන් ග්‍රාමීන් සමාගම දැන් තවත් පොහොසත්....."

රූපලාවන්‍යාගාර යනු බොහෝ සිත් ඇද ගන්නා සුළු ව්‍යාපාර විශේෂයකි. චාමලි සුරංගිකා "සැලෝන් චමි" නමින් ආරම්භ කළ ඇගේ ව්‍යාපාරය අද පවතින මට්ටම තෙක් වර්ධනය කරගනු පිණිස උපකාරී කර ගනු ලැබුවේ ප්‍රයිම් ග්‍රාමීන් ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමයයි. ඇගේ ව්‍යාපාරයට ග්‍රාමීන් සමාගමෙන් ලැබුණු අතහිත පිළිබඳව චාමලී දැක්වූයේ මෙබඳු අදහසකි.



මනාලියන් හැඩගැන්වීම, කොන්ඩා කැපීම, මෝස්තර දැමීම ඇතුළු සියළුම රූපලාවන්‍ය කටයුතු අපි මෙතැන කරනවා. මමත් මගේ මහත්තයත් හවුලේ ආරම්භ කරපු මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ඊට අවශ්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා ග්‍රාමීන් සමාගමේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය අපිට විශාල පිටිවහලක් වුණා. මම මේ ව්‍යාපාරය පටන් ගන්න කලින් සිල්ලර කඩ ව්‍යාපාරයක් කළා. ඒකට මම ඒ කාලේ රු 25000/- ණය මුදලක් පවා අරන් තියෙනවා.ඉන් පස්සෙ තමයි මේ ව්‍යාපාරය පටන් ගත්තේ. එදා වගේම අදත් හිතවත් කමෙන් සහ විශ්වාසයෙන්ද පෙරටත් වැඩි ශක්තියකින් යුතුවද ග්‍රාමීන් සමාගම අපට උදව් කරනවා.

**චාමලී සුරංගිකා**
**සැලෝන් චමි, නුවර පාර, ගෙලිඔය.**

## අමුද්‍රව්‍ය මිළදී ගැනීම පිළිබඳ ගැටළුවට අපිට විසඳුමක් ලැබුනේ ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වීමත් එක්කයි



ගල්වැලි නැති ශුද්ධ කරන ලද සහල් වෙළෙඳ පොළට පැමිණීමත් සමඟ කුල්ල නගරාසන්නයේ බොහෝ නිවෙස් වලින් අතුරුදහන් වූ උපකරණයක් බවට පත්විය.නගරයේ තත්වය එසේ වුවද අදත් ඈත එපිට කෘෂිකාර්මික ගම්මානයන්හි කුල්ලට හිමි තැන නොනැසී පවතී.නුවර හන්දෙස්ස ප්‍රදේශය කුළු නිෂ්පාදකයන්ගේ ගම්මානයක් ලෙස අදටත් නොනැසී පාරම්පරිකව පැවත එන්නේ ඒ ඉල්ලුමට අවැසි සැපයුම සපුරාලනු පිණිසය.
"අපි මේ ව්‍යාපාරයේ පාරම්පරිකව නියැලෙන පිරිස්. අපි නිෂ්පාදනය කරන කුළු දඹුල්ල, මාතලේ, මිහින්තලේ, කැකිරාව,තිරප්පනේ,ගල්කුලම,තෙරිපැහැ, වගේ ප්‍රදේශ වලට අපිම බස්වල පටවගෙන අරන් ගිහින් කඩවලට දානවා. ගෙනියන ප්‍රමාණය තීරණය වෙන්නෙ ඉල්ලුම අනුවයි. මේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය උණ ලී සහ වෙනත් අමුද්‍රව්‍ය මිළදී ගැනීම පිළිබඳ ගැටළුවකට මුල් කාලේ අපි මුහුණ දුන්නා. ඒකට විසඳුමක් අපිට ලැබුනේ ග්‍රාමීන් මධ්‍යස්ථානයක් නාරංවල පිහිටුවීමත් එක්කයි.රු10,000 ඉඳලා 60,000, වෙනකල් වරින් වර අවශ්‍යතාවය අනුව අපි ණය මුදල් ලබා ගන්නවා. ග්‍රාමීන් සමාගමේ මේ ණය ක්‍රමවේදය අපි වගේ සුළු පරිමාණයේ ව්‍යාපාරකයින්ට ඉතා වැදගත්.

**ශ්‍රියාණි මංජුලා - හන්දෙස්ස**




ජුලි සහ අගොස්තු මාසයේ උපන්දිනය සමරන එච් එන් බී ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමඟ පිරිනමමු !

| නම | දිනය | ශාඛාව |
|---|---|---|
| චිරංග ශ්‍රීමාල් මහතා | ජුලි 16 | මැදවච්චිය |
| නිව්ටන් පුෂ්පකුමාර මහතා | ජුලි 16 | මහියංගනය |
| සඳරුවන් දිසානායක මහතා | ජුලි 16 | මහියංගනය |
| සුනන්ද මෙන්ඩිස් මහතා | ජුලි 17 | ප්‍රධාන කාර්යාලය |
| මධුජිත් ප්‍රියංකර මහතා | ජුලි 17 | අම්බලන්ගොඩ |
| යසිත ශාන්ත මහතා | ජුලි 17 | මොනරාගල |
| වසන්ත කුමාර මහතා | ජුලි 18 | හෝමාගම |
| සම්පත් කරුණාරත්න මහතා | ජුලි 18 | මොනරාගල |
| චිරන්ද විතානගේ මහතා | ජුලි 19 | මාතර |
| කේ. සුබ්‍රමනියම් මහතා | ජුලි 19 | නුවරඑළිය |
| ධනංජය කුමාරසිරි මහතා | ජුලි 19 | මතුගම |
| සුගත් බණ්ඩාර මහතා | ජුලි 20 | නගර ශාඛාව |
| බන්දුල අබේවික්‍රම මහතා | ජුලි 20 | වැලිමඩ |
| වගීෂා අබේවික්‍රම මෙනෙවිය | ජුලි 20 | ප්‍රධාන කාර්යාලය |
| සුරංග ලියන්දෙණිය මහතා | ජුලි 20 | මහියංගනය |
| ඉංදික මුදලිගේ මහතා | ජුලි 21 | හොරණ |
| මනෝජ් ශ්‍රී බණ්ඩාර මහතා | ජුලි 21 | බදුල්ල |
| ගාමිණී ආරියසිංහ මහතා | ජුලි 22 | ප්‍රධාන කාර්යාලය |
| ශ්‍රීනාත් හේරත් මහතා | ජුලි 22 | නිකවැරටිය |
| අනුර ධනංජය මහතා | ජුලි 23 | නිකවැරටිය |
| අනුර කුමාර මහතා | ජුලි 23 | පොළොන්නරුව |
| චිරංග දයානන්ද මහතා | ජුලි 23 | අවිස්සාවේල්ල |
| ශිවනායගම් යසාන්ත් මහතා | ජුලි 23 | මඩකලපුව |
| කමල් ප්‍රියදර්ශන මහතා | ජුලි 24 | ප්‍රධාන කාර්යාලය |
| එස් විවේකානන්දන් මහතා | ජුලි 24 | මුලතිව් |
| සිනෙත් දිලීෂ මහතා | ජුලි 24 | මොරටුව |
| ප්‍රභාත් මධුසංඛ මහතා | ජුලි 25 | මාතර |
| කොඩිතුවක්කුගේ ප්‍රියන්ත මහතා | ජුලි 25 | හම්බන්තොට |
| ශානක රුක්ෂාන් මහතා | ජුලි 25 | කුරුණෑගල |
| රෂී හේෂානි මෙනෙවිය | ජුලි 26 | බෙලිඅත්ත |
| නිරෝෂන් ධර්මප්‍රිය මහතා | ජුලි 27 | කුලියාපිටිය |
| සුමිත් ප්‍රියන්ත මහතා | ජුලි 27 | ප්‍රධාන කාර්යාලය |
| සංජය පෙරේරා මහතා | ජුලි 27 | කන්තලේ |
| කැළුම් චතුරංග මහතා | ජුලි 27 | වෙන්නප්පුව |
| උදාර බණ්ඩාර මහතා | ජුලි 28 | පුත්තලම |
| සුදිත ජයසිංහ මහතා | ජුලි 28 | නිට්ටඹුව |
| සුමේධ ප්‍රනාන්දු මහතා | ජුලි 29 | අම්පාර |
| රුක්ෂාන් කැළුම් මහතා | ජුලි 29 | වෙන්නප්පුව |
| සාගර සම්පත් මහතා | ජුලි 30 | වැලිමඩ |
| එඩ්වින් ලතීෆ් මහතා | ජුලි 30 | මල්ලාවි |
| සංජීව සුරංග මහතා | ජුලි 30 | මොරටුව |
| දනුෂ්කර දිලන්ක මහතා | ජුලි 30 | අනුරාධපුර |
| රුක්ෂාන් පෙරේරා මහතා | ජුලි 31 | මාතර |
| ප්‍රභාෂ් ගුණසේකර මහතා | ජුලි 31 | අවිස්සාවේල්ල |
| පුබුදු චින්තක මහතා | ජුලි 31 | ඇඹිලිපිටිය |
| හේමාල් දේශප්‍රිය මහතා | අගෝ. 01 | නුවරඑළිය |
| කුමාරෙසන් වහීසන් මහතා | අගෝ. 01 | මල්ලාවි |
| උපුල් සාන්ත කුමාර මහතා | අගෝ. 02 | පොතුවිල් |
| අනුර ලක්සිරි මහතා | අගෝ. 02 | බෙලිඅත්ත |
| එල්. රශිව් මහතා | අගෝ. 02 | මල්ලාවි |
| ලක්ෂික මධුජීව මහතා | අගෝ. 02 | බදුල්ල |
| චන්ද්‍රසේකරන් ක්‍රිශාන්තන් මහතා | අගෝ. 02 | නුවර එළිය |
| ලලිත් ද සිල්වා මහතා | අගෝ. 03 | නුවරඑළිය |
| එම්.ඊෂ්වරන් මහතා | අගෝ. 03 | මඩකලපුව |
| විශ්ව දිල්ෂාන් මහතා | අගෝ. 03 | හලාවත |
| ඉෂාන් රණසිංහ මහතා | අගෝ. 03 | ගල්ගමුව |
| ඒ .ආර් එම්.ජම්සිත් මහතා | අගෝ. 04 | පොතුවිල් |
| ඩබ්.කේ.ඒ. ප්‍රියංකර මහතා | අගෝ. 05 | බෙලිඅත්ත |
| සුදත් ගුණරත්න මහතා | අගෝ. 05 | නාවලපිටිය |
| ජේ. අභිෂේක් මහතා | අගෝ. 05 | කුලියාපිටිය |
| විශ්ව පෙරේරා මහතා | අගෝ. 06 | ප්‍රධාන කාර්යාලය |
| යෝගනාදන් සුජර්මන් | අගෝ. 06 | අම්පාර |
| තිසර සඳරුවන් මහතා | අගෝ. 07 | මාතර |
| මාධව ප්‍රේමරත්න මහතා | අගෝ. 07 | ගල්ගමුව |
| තිලාන් අනුර බණ්ඩාර | අගෝ. 07 | මොනරාගල |
| පී තිලකේෂ්වරන් මහතා | අගෝ. 08 | කිලිනොච්චි |
| සනත් නන්දන මහතා | අගෝ. 08 | මහියංගනය |
| ශානක මධුරංග මහතා | අගෝ. 08 | හෝමාගම |
| චානක පතිරණ මහතා | අගෝ. 08 | හලාවත |
| තුෂාර සංජීව මහතා | අගෝ. 08 | මතුගම |
| ජනක බණ්ඩාර මහතා | අගෝ. 09 | පොළොන්නරුව |
| නිශාන්ත බණ්ඩාර මහතා | අගෝ. 09 | නුවර |
| රමිත සිල්වා මහතා | අගෝ. 09 | වෙන්නප්පුව |
| කුමාර පීරිස් මහතා | අගෝ. 09 | මොරටුව |
| ලහිරු චතුරංග මහතා | අගෝ. 10 | කන්තලේ |
| ලහිරු දුලාන් මහතා | අගෝ. 10 | කළුතර |
| ලලිත් වසන්ත මහතා | අගෝ. 12 | හම්බන්තොට |
| සුරංග ජයලාල් මහතා | අගෝ. 12 | පොළොන්නරුව |
| දීඝායු චිත්‍රසේන මහතා | අගෝ. 12 | කළුතර |
| මහේෂ් කුමාර මහතා | අගෝ. 13 | ප්‍රධාන කාර්යාලය |
| ආසිරි උදයකුමාර මහතා | අගෝ. 13 | අවිස්සාවේල්ල |
| ආර්. තිරුචෙල්වම් මහතා | අගෝ. 13 | නුවරඑළිය |
| අසංක ඉංදික මහතා | අගෝ. 13 | අම්බලන්ගොඩ |
| උදේශ් හෂාන් පීරිස් මහතා | අගෝ. 13 | මීගමුව |
| නුරේෂ් ප්‍රනාන්දු මහතා | අගෝ. 14 | මීගමුව |
| අමිල බුද්ධික මහතා | අගෝ. 14 | මීගමුව |
| කේ කන්දීපන් මහතා | අගෝ. 14 | ත්‍රිකුණාමලය |
| සම්මික ගුණවර්ධන මහතා | අගෝ. 14 | අනුරාධපුර |
| ජාන් සංදුක මහතා | අගෝ. 14 | හම්බන්තොට |

මෙහෙවර
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් ඃ 0112825843
ඊ-මේල් :- manjula.p@hnbgrameen.lk
වෙබ් :- www.hnbgrameen.com
අධික්ෂණය :- චමින්ද ප්‍රභාත් (කළමනාකාර අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිළධාරි)
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- කේ.ඩී. චමිල චින්තක (අර්ජුන ග්‍රැෆික්ස් (පුද්) සමාගම)
ඡායාරූප ශිල්පි :- ලක්ෂ්මන් කුමාරතුංග

**නිදහසේ සිතීම නිසා නව නිර්මාණ ලොවට බිහි වී ඔබ මහා ධනවතෙකු වේ.**